දරුවන් උදෙසා
බයිබලයක්

# එසකියෙල්: දර්ශන දුටු මිනිසා



ඉදිරිපත් කරන්නා: Edward Hughes

නිදර්ශනය කරන්නා: Lazarus
Alastair Paterson

සකස්කරන්නා: Ruth Klassen

පරිවර්ථනය කරන්නා

නිෂ්පාදනය කරන්නා: Bible for Children
www.M1914.org

©2023 Bible for Children, Inc.
අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර ඇතිමුත් එය විකිණීමට අවසර නැත.

බොහෝ කලකට පෙර, බලවත් හමුදාවන් ජුදයට පහර දුන් අතර, දෙවියන් වහන්සේගේ සෙනඟගෙන් බොහෝ දෙනෙකුව වහලුන් ලෙස බබිලෝනියට ගෙන යන ලද්දේය. මෙම ජුදෙව්වෝ තම දේශයෙන් බොහෝ දුරින් වූ කෙබාර් ගඟ අසල ජීවත් වූවෝය. ඔවුන් අතර දෙවියන් වහන්සේගේ සේවකයෙකු වූ අනාගතවක්තෘ



දිනක් දෙවියන් වහන්සේ එසකියෙල්ට දර්ශනයක් පෙනෙන්නට සැලැස්වූ සේක. දෙවියන් වහන්සේගේ තේජස දීප්තිමත් ආලෝකයක් ලෙස, ගිනිමය ජීවීන් හතර දෙනෙකුගේ ස්වරූපයෙන් දිස් විය. එකිනෙකාට මුහුණු හතරක් සහ පියාපත් හතරක් බැගින් තිබුණි. ඒවාට උඩින් තිබුණේ දිලිසෙන දේදුනු වැනි ආලෝකයෙන් පිරුණු අලංකාර නිල් මැණික් සිංහාසනයකි. එසකියෙල් එය දුටු විට මුහුණින් වැටුණේය.



දෙවියන් වහන්සේ එසකියෙල්ට කතා කළ සේක. “මම ඔබව ඊශ්‍රායෙල් පුත්‍රයන් වෙතට යවමි. ඔවුන් කැරළිකාර බැවින් මාගේ වචන ඔවුන්ට පවසන්න.” අකුලන ලියවිල්ලක් සහිත අතක් දිස් විය. “මේ ලියවිල්ල කන්න. ඉන්පසු ගොස් ඊශ්‍රායෙල් වංශයට කතා කරන්නයැ”යි දෙවියන් වහන්සේ කීසේක.



මොනතරම් අමුතු ආකාරයේ විධානයක්ද? නමුත් එසකියෙල් කීකරු වී, ලියවිල්ල අනුභව කර පිටත්ව ගියේය.

දෙවියන් වහන්සේගේ ආත්මය එසකියෙල්ව ඔසවා කෙබාර් ගඟ අසල වෙනත් ස්ථානයක ජීවත් වූ වහල්භාවයේ සිටි ජුදෙව්වන් වෙත ගෙන ගියේය. දින හතක් ඔහු ඔවුන් වාඩි වී සිටි තැනම වාඩි වී සිටියේය. ඔහු දුටු දෙයින් පුදුමයට පත් වූයේය. ඉන්පසු දෙවියන් වහන්සේ එසකියෙල්ව මුරකරුවෙකු කොට පත් කළ සේක. දෙවියන් වහන්සේට අකීකරු නොවන සේ දුෂ්ඨ මිනිසුන්ට අනතුරු ඇඟවීම ඔහු හට පැවරී තිබුණි.





එසකියෙල් මිනිසුන්ට දෙවියන් වහන්සේගේ වචනය පැහැදිලි කිරීමට බොහෝ අමුතු දේවල් කළේය. ඔහු මැටි පුවරුවක ජෙරුසලමේ පින්තූරයක් ඇන්දේය. සමහරවිට ඔහු ජෙරුසලම වටා බලවත් හමුදාවක රූප අදින අතරතුර මිනිසුන් ඔහුගේ උරහිස උඩින් ඒ චිත්‍රය දෙස බැලුවා විය හැකිය. ඔහු පෙන්වමින් සිටියේ දෙවියන් වහන්සේගේ ශුද්ධ නුවර ළඟදීම විනාශ වන බවය.

ඊශ්‍රායෙලයේ උතුරු රාජ්‍යය වසර 390ක් දෙවියන් වහන්සේට අකීකරු වූ අතර දකුණු රාජ්‍යය වූ ජුදයාව වසර 40ක් පුරාවට දෙවියන් වහන්සේට අකීකරු විය. ඊශ්‍රායෙල්වරුන් විනාශ වී තිබුණේත් යුදා දේශය ඉක්මනින්ම බිඳ වැටුණේත් ඒ නිසාය. දෙවියන් වහන්සේ එසකියෙල්ට දින 390ක් ඔහුගේ වම් පැත්තට වැතිර සිටින ලෙසත්, පසුව දින 40ක් ඔහුගේ දකුණු පැත්තට වැතිර සිටින ලෙසත් කීසේක. ඒ, මිනිසුන්ට ඔවුන්ගේ කළ පාපයේ අවුරුදු ගණන මතක් කර දෙනු සඳහාය.





ඇතැම්විට එසකියෙල් බෙහෙවින් අමුතු මිනිසෙකු ලෙස මිනිසුන් සිතුවා විය හැකිය. දෙවියන් වහන්සේ ඔහුට කී සෑම දෙයක්ම ඔහු කළේය. දිනක් ඔහු තම හිසකෙස් කපා එයින් තුනෙන් එකක් පුළුස්සා දැමුවේය. එසේ කළේ බැබිලෝනියේ හමුදාව නගරයට පහර දුන් විට යෙරුසලමේ වැසියන්ගෙන් තුනෙන් එකක් රෝග හා සාගතයෙන් මිය යන බව පෙන්වීමටය.



එසකියෙල් ඔහුගේ හිසකෙස්වලින් තවත් තුනෙන් කොටසක් ගෙන කඩුවෙන් කැබලි වලට කපා දැමීය. මෙය මිනිසුන්ගෙන් තුනෙන් එකක් වූ පිරිස සතුරු කඩුවලින් මිය යන බව පෙන්වීමටය. අවසන් තුනෙන් එක් කොටස, එසකියෙල් සුළඟේ විසිර යැව්වේය. නමුත් ඔහු තම වස්ත්‍රයේ වාටියේ හිසකෙස් කිහිපයක් රඳවා ගත්තේය. ඒ, දෙවියන් වහන්සේ තම සෙනඟගෙන් සමහරෙකු සුරක්ෂිතව තබා ඔවුන්ව පොරොන්දු දේශයට



ආපසු ගෙන යන බවට ලකුණක් වශයෙනි.

මෙම නිර්භීත අනාගතවක්තෘවරයා
වහල්භාවයේ සිටි ජුදෙව්වන්ට පැවසුවේ ඔවුන්
බලාපොරොත්තු වූ පරිදි සිදු නොවී තත්වය
වඩාත් නරක අතට හැරෙනු ඇති බවයි.
එසකියෙල් සමඟ සෙනඟ කෝපයට
පත් වූ නමුත් ඔහු දිගටම දෙවියන්
වහන්සේගේ වචනය දේශනා
කළේය. දිනක් ඔහු ඊශ්‍රායෙල්හි
වැඩිමහල්ලන් සමඟ හිඳගෙන
සිටියදී දෙවියන් වහන්සේ
එසකියෙල්ට දර්ශනයක්
පෙනෙන්නට සැලැස්වූ
සේක. දර්ශනයේදී,
දෙවියන් වහන්සේ
ඔහුගේ
හිසකෙස්වලින් ඔහුව
ඔසවාගෙන යෙරුසලමේ
දේවමාළිගාවට ගෙන ගිය සේක.



දේවමාළිගාවේදී දෙවියන් වහන්සේ එසකියෙල්ට බඩගා යන සතුන්, අපිරිසිදු මෘගයන් සහ පිළිම පෙන්වූ සේක. මේවා කිසි දිනක දෙවියන් වහන්සේගේ මාළිගාවේ නොතිබිය යුතුය.



නායකයෝ දෙවියන් වහන්සේ වෙනුවට මේවාට නමස්කාර කළෝය. දෙවියන් වහන්සේ එසකියෙල්ට පෙන්වූයේ උන්වහන්සේගේ මහිමය දේවමාළිගාවෙන් පිටව යන බවත්, දේවමාළිගාව විනාශ වන බවත්ය. දර්ශනය අවසන් වූ පසු, එසකියෙල් ඒ ගැන යුදෙව්වන්ට කීවේය.





දෙවියන් වහන්සේ කී සියල්ල සැබෑ විය. ජෙරුසලම
විනාශ විය. බොහෝ මිනිස්සු මිය ගියෝය.
බබිලෝනියේ වහල්භාවයේ සිටි ජුදෙව්වෝ එය
ඇසූ විට, දෙවියන් වහන්සේ තම සෙනඟ සදහටම
අත්හැර දමා ඇත්දැයි කල්පනා කළෝය.

නමුත් දෙවියන් වහන්සේ තම අනාගතවක්තෘවරයාට තවත් පණිවිඩයක් ලබා දුන් සේක. උන්වහන්සේ එසකියෙල්ව වියළි ඇටකටුවලින් පිරුණු මිටියාවතකට ගෙන ගිය සේක. ඒවා මිනිස් ඇටකටු විය.



“මනුෂ්‍ය පුත්‍රය, මේ ඇටකටු වලට නැවත ජීවත් විය හැකිද?” දෙවියන් වහන්සේ එසකියෙල්ගෙන් ඇසූ සේක. “දෙවි ස්වාමින් වහන්ස, එය දන්නෝ ඔබවහන්සේය” කියා එසකියෙල් පිළිතුරු දුන්නේය. සැබැවින්ම වියළි ඇටකටු නැවත ජීවත් නොවන්නේය. ස්වාමින් වහන්සේ එසකියෙල්ට කතා කරමින් “මේ වියළි ඇටකටු වලට අනාගත වාක්‍ය කියන්න, වියළි ඇට, ස්වාමින් වහන්සේගේ වචනය අසන්න. ඔබ ජීවත් වනු ඇත කියා පවසන්නයැ”යි කීසේක.



අනාගතවක්තෘ වරයා විශ්මයෙන් බලා සිටියදී ඇටකටු එකින් එක එකතු වී ශරීර සෑදුනේය.



ඉන්පසු ඒවා මත මාංශය හට ගැනිණි.



මාංශය සමින් වැසී ගියේය. නමුත් ඒ ශරීර වල හුස්ම නොතිබුණි.



එවිට ස්වාමීන් වහන්සේ කථාකොට: “මනුෂ්‍ය පුත්‍රය, නුඹ අනාගතවාක්‍ය කියමින් සුළඟට කතා කොට එම්බා ආත්මය, නුඹ සතර දිග සුළංවලින් ඇවිත් මොවුන් ජීවත්වන පිණිස මොවුන් තුළට හුස්ම හෙළන්න කියා කියන්නයැ”යි කීසේක. එසකියෙල් එසේ කළ විට ඔවුන් තුළට හුස්ම පැමිණියේය. ඔවුහු ජීවත්ව නැඟිට සිටියෝය. නිම්නය, විශාල හමුදාවකින් පිරී ගියේය.



ජෙරුසලම බිඳ වැටුණු විට බබිලෝනියේ සිටි යුදෙව්වන්ගේ බලාපොරොත්තු සුන් වන බව දෙවියන් වහන්සේ දැන සිටිය සේක. එසකියෙල්ගේ දර්ශනය තුළින් උන්වහන්සේ පණිවිඩයක් යැවූ සේක. “මේ ඇටකටු නම් මුළු ඊශ්‍රායෙල් වංශයය. මම මාගේ ආත්මය ඔබ තුළ තබා, ඔබේම දේශයේ ඔබව තබන්නෙමි”යි දෙවියන් වහන්සේ කීසේක.



දෙවියන් වහන්සේගෙන් ලැබුන බලාපොරොත්තුවේ පණිවිඩය මොන තරම් විශිෂ්ඨද? එසකියෙල් මාර්ගයෙන් දෙවියන්වහන්සේ දුන් පොරොන්දු ඉටු වූයේ ජුදෙව්වන් ඔවුන්ගේම දේශයට පසුව පැමිණි විටදීය. ස්වාමිවූ දෙවියන් වහන්සේ නැවත ඔවුන්ව තම දේශයට ගෙන ආ බව ඔවුන් දැන සිටියෝය. දෙවියන් වහන්සේගේ වචනය සෑම විටම සැබෑ වන්නේය.



එසකියෙල්: දර්ශන දුටු මිනිසා

**දේව වචනයෙන් එක් කථාවක්**

**බයිබලයේ**

එසකියෙල්

**"ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ"**
**ගීතාවලිය** 119:130

# අවසානය

මෙම බයිබල් කථාන්තරය අපට පවසනුයේ, අප සෑදූ අපගේ මහෝත්තම දෙවියන් වහන්සේ පිළිබඳ දැනගෙන උන් වහන්සේ කව්දැ යි කියා හඳුනාගන්නා ලෙසයි.

දෙවියන් වහන්සේ විසින් පාපය යයි සලකන, අයහපත් දේ අප විසින් කර ඇති බව උන් වහන්සේ දන්නා සේක. පාපයට දඬුවම මරණයයි. එහෙත් දෙවියන් වහන්සේ අපට බොහෝ සේ ප්‍රේම කරන බැවින් උන් වහන්සේගේ එකම පුත්‍රයා අප වෙත එවූ සේක. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විඳිමින් ඔබේ පව් උදෙසා මරණයට පත් වු සේක. ජේසුස් වහන්සේ මරණයෙන් නැඟිට, තමාගේ නිවස වන ස්වර්ගයට ගිය සේක. ඔබ ජේසුස් වහන්සේ පිළිගෙන ඔබගේ පාපයට කමාව අයැදින විට උන් වහන්සේ ඔබට කමාව දෙන සේක. එවිට උන් වහන්සේ ඔබ සමඟ ජීවත් වනු ඇත. ඔබට ද සදාකල්හිම උන් වහන්සේ සමඟ ජීවත් විය හැක.

මෙම සත්‍යය ඔබ පිළිගන්නේ නම් ජේසුස් වහන්සේට මෙසේ පවසන්න.

ආදරණීය ජේසුස් වහන්ස, ඔබ වහන්සේ, දෙවියන් වහන්සේ බව මම විශ්වාස කරමි. ඔබ වහන්සේ මිනිස් බව ගෙන මාගේ පාපය වෙනුවෙන් දිවි පුදා දැන් නැවතත් ජීවමානව වැඩසිටින සේක. මගේ ජීවිතයට පැමිණ මාගේ පාප කමා කරන මෙන් ඉල්ලා සිටිමි. එවිට මට ඔබ වහන්සේ සමඟ අලුත් ජීවිතයක් ගතකිරීමට හැකි ය. ඔබ වහන්සේ සමඟ සදාකාල ජීවිතයට ද මට දිනක් උදා වනු ඇත. ආමෙන්.

දිනපතා බයිබලය කියවා දෙවියන් වහන්සේ සමඟ කතා කරන්න (ශු. ජොහන් 3:16)